# 'ජන අරගල' ගමනේ දිසාව
# ඔවුන්ගේම කතාබහෙන් හඳුනා ගනිමු

2011 සැප්තැම්බරයේ දී පමණ විවෘත සමාජයේ කතා බහට ලක්වුණ, ජනතා විමුක්ති පෙරමුණේ අභ්‍යන්තර ප්‍රශ්නය සම්බන්ධයෙන් විවිධ අය අදහස් ඉදිරිපත් කරනු ලැබුවා. ජවිපෙ න් ඉවත් වූ කණ්ඩායම ජවිපෙ නායකත්වයට චෝදනා ගණනාවක්ම එල්ල කළා. එම චෝදනාවලට ජවිපෙ නායකත්වය විසින් විටින් විට පිළිතුරු දෙනු ලැබුවේ 'ඒව අභූත චෝදනා' කියලා. ඉවත් වූ කණ්ඩායම (කැරලිකාර කණ්ඩායම) කිව්වේ 'නෑ, ඒව ඔක්කොම ඇත්ත. ඒ විවේචන ඔරොත්තු දෙන්නෙ නැති එක තමයි, මේ ගොල්ලන්ගේ ලොකුම වරද.' කියල.

ඉවත් වූ කණ්ඩායම ජවිපෙ නායකත්වයට චෝදනා එල්ල කළා වගේම තමන් ගැනත් කිව්වා. ඔවුන්ට හැම මාධ්‍යයක්ම පාහේ හොඳ ඉඩ කඩකුත් ලබා දුන්නා.

කවුද හරි - කවුද වැරදි කියලා හොයල බලද්දී මේ කැරලිකාර කණ්ඩායමේ නායකයින් විටින් විට ජනමාධ්‍ය හරහා කරපු ප්‍රකාශ වැදගත් වෙනවා. එහි නායකයින් සම්මුඛ සාකච්ඡා හරහා තමන්ගේ අදහස් කිව්වා. ඒවා ඒ අයගේ නම් වලින්ම ජන මාධ්‍යවල පළවුණා. තවත් අවස්ථාවක සමහර අදහස් පළවුණා, 'කැරලිකාර කණ්ඩායමේ නායකයෙක් මෙසේ කියයි' කියල. එවැනි කරුණු ගැන 'නෑ ඒක වැරදියි, අපේ ස්ථාවරය ඕක නෙවෙයි.' කියල එම කණ්ඩායමේ කවුරුවත් කියල තිබුණෙ නෑ. ඒ නිසා අපට හිතන්න තියෙන්නෙ 'ඒ පළවුනු අදහස ඒ ගොල්ලන්ගෙ අදහස ම තමයි' කියල.

දැන් අපි බලමු, මේ එකි'නෙකා මොනවද කියල තියෙන්නෙ කියල. එතකොට අපිටම පුළුවන් වෙයි, කවුද හරි - කවුද වැරදි කියල තේරුම් ගන්න.

ජන මාධ්‍ය වලට ප්‍රකාශ නිකුත් කරද්දී, සම්මුඛ සාකච්ඡා දෙද්දී මේ කැරලිකාර කණ්ඩායමේ නායකයෝ කීපදෙනෙක් කැපී පෙනුණා. සේනාධීර ගුණතිලක (ඕපාත) පුබුදු ජයගොඩ (ලසිත්) ජී.කුලරත්න (සරත්) වරුණ රාජපක්ෂ සහ චමීර කොස්වත්ත මේ අතර ප්‍රධාන තැනක් ගත්තා. පවතින දේශපාලන තත්ත්වය සම්බන්ධවත්, ජවිපෙ අභ්‍යන්තර ප්‍රශ්ණයට බලපාපු හේතු සම්බන්ධවත්, තම තමන් කටයුතු කරන ආකාරය ගැනත් විවිධ අදහස් ඉදිරිපත් කරල තිබුණා. එක වෙලාවකට මේ එකි'නෙකා එකම කාරණය ගැන කියපු කතා අතර පවා පරස්පරයන් තිබුණා.

පුබුදු ජයගොඩ 1994 ජවිපෙ නැවත දේශපාලන කටයුතු ආරම්භ කිරීම සම්බන්ධයෙන් කිව්වේ මෙහෙම කතාවක්.

> ''හිතේ හයියට සමාජවාදයේ කොඩිය ගන්න බැහැ. අපට ගැඹුරු විශ්ලේෂණයක් තිබිය යුතුව තිබුණා.''
>
> **(පුබුදු ජයගොඩ - රාවය 2011.දෙසැ.11 සංවාද 9 පිටුව)**

1994 කියන්නෙ ජවිපෙ නට්ටං කරල දාපු කාලයක්. හිටපු ආරක්ෂක ඇමති රංජන් විජේරත්න ම කිව්වෙ 'JVP එකත් එක්ක තිබුණ ගේම් එක ෆිනිෂ් කළා' කියල. එහෙම වෙලාවක 94 ඡන්දෙ නාමයෝජනා දෙන්න, නම් එකතු කෙරුවෙ ලාභට ගෙම්බො එකතු කරනව වගෙයි. ඒ නිසා ගැඹුරු විශ්ලේෂණ පැත්තක තියෙද්දි 'සමාජවාදයේ කොඩිය අතට ගත්තු එකම ලොකු දෙයක්.' කියලයි මැදහත් සමහරු කියන්නේ.

1994 ගැන ඕපාත කියන්නෙ වෙනස් කතාවක්.

> ''1994 කියල කියන්නෙ පක්ෂයේ තීරණාත්මක සන්ධිස්ථානයක්. ඒ වෙලාවෙ නැවත පක්ෂය ගොඩනගන්න, පක්ෂය එක මිටකට ගන්න උර දැරුවේ ඇත්තටම සහෝදරවරුන් කීප දෙනෙක් විතරයි.''

*"අවලාදවලින් අපේ අරගලය යටකරන්න බැහැ" යන හිසින් ඕපාතගේ සම්මුඛ සාකච්ඡාව*

*(ජවිපෙ කැරලිකාර පිලේ ඕපාත - රිවිර 2011 ඔක්.09 පිටුව 11)*

ජවිපෙ තුළ මතුවී ඇති ව්‍යාකූල තත්ත්වය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා මන්ත්‍රී වරුණ දීප්ත රාජපක්ෂ කියන්නෙ මෙහෙම කතාවක්.

''පක්ෂයේ අර්බුදයක් නැහැ. තියෙන්නෙ මතවාදී විවාදයක්.''

*(වරුණ දීප්ත රාජපක්ෂ ලක්බිම පුවත්පත)*

මේ කියන 'මතවාදී විවාදය' ගැන එම කණ්ඩායමේ ඕපාත කියන්නෙ මෙහෙමයි.

''2004 වසරේ සිට පක්ෂය වමට පිටුපාමින් ගමන් කළා. ... ජනතා විමුක්ති පෙරමුණ මේ ක්‍රමයේම ගොදුරක් බවට පත්වුනා. ... 2004 වසරින් පසුව තමයි මේ ඇද වැටීම සිදු වුනේ.''

*(සේනාධීර ගුණතිලක (ඕපාත) ලක්බිම 2011 නොවැ.08 පිටුව 4)*

ඒ සේනාධීර ගුණතිලකම ලංකාදීප පුවත්පතට කියන්නෙ මෙහෙමයි.

''2000 න් පස්සෙ පරණ වම තිබුණ තැනට ජවිපෙ වැටුනා.''

*(ඕපාත (සේනාධීර ගුණතිලක) ලංකාදීප 2011.නොවැ.05)*

මේ ප්‍රකාශ දෙකෙන් පෙනෙන්නේ ඕපාතම ඕපාතට එරෙහිව සිටින හැටියි. එක තැනක 2000. අනිත් තැන 2004.

මේ 'එකි'නෙකාගෙ කතා අරගෙන බැලුවම පෙනෙන එක දෙයක් තියෙනව. එනම්, මේ එකි'නෙක අය අතර ඒකමතික භාවයක් නැහැ' කියන එකයි. එකි'නෙකා අතර නෙවෙයි එකම කෙනා එකම සිද්ධිය සම්බන්ධයෙන් වතාවල් දෙකක කරන ප්‍රකාශ පවා එකට එකක් පටහැනියි; පරස්පරයි. මේවයින් පේන්නෙ ඉලක්කයක් නැතුව ඉබාගාතේ යන ගමනක් වගේ එකක්.

''ජවිපෙ කැරලිකාර කණ්ඩායමෙන් අළුත් දේශපාලන පක්ෂයක්. අරමුණ සැබෑ වාමවාදී බහුජන ව්‍යාපාරයක් ගොඩනැගීම. කැරලිකාර කණ්ඩායමේ ඕපාත කියයි.

*(ලංකාදීප 2011.10.05 මුල් පුවත)*

ලංකාදීප පත්තරේ දයාසීලී ලියනගේ අහනව ප්‍රශ්නයක්. ඕපාත උත්තර දෙනව මෙහෙම.

''ප්‍රශ්නය :- අළුත් පක්ෂයක් පිහිටුවීමේ අරමුණ මොකක්ද?
පිළිතුර :- අළුත් පක්ෂයක් පිහිටුවීමේ සැළැස්මක් අපට නැහැ.

*(ඕපාත - "ජවිපෙ බලය අල්ලන්න කුමන්ත්‍රණයක් නෑ" හිසින් වූ සාකච්ඡාව - ඉරිදා ලංකාදීප 2011 ඔක්.09 පිටුව 08)*

''ඇත්තටම අපේ අරගලය අළුත් දේශපාලන පක්ෂයක් හදන්න නෙවෙයි.''

*(ඕපාත - රිවිර 2011 ඔක්.09 පිටුව 11)*

2011. 10. 05 අළුත් පක්ෂයක් හදන බව කියන ඕපාත 2011.10.09 දා කියනව අළුත් පක්ෂයක් හදන්නෙ නෑ කියල. ඕපාත එහෙම කියද්දී ජී. කුලරත්න කියන්නෙ වෙනත් කතාවක්.

''ජනතා විමුක්ති පෙරමුණේ නිල නාමය හෝ අයිතිය ලබාගැනීමට අපට අවශ්‍ය නැහැ. අපි දැන් වෙනත් දේශපාලන ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා කටයුතු කරමින් සිටිනවා.''

*(ජී.කුලරත්න - ලක්බිම සංජය නල්ලපෙරුම විසින් පවතවන ලද සම්මුඛ සාකච්ඡාව 2012 ජනවාරි 11)*

මේ දෙන්න ගේ කතා දෙකත් පරස්පරයිනෙ. ඒ දෙන්න ගේ කතා දෙක විතරක් නෙවෙයි, ඕපාත ගෙ ඉහතින් තිබුණ ප්‍රකාශයත් එක්ක ඕපාත ගෙම මේ ප්‍රකාශයත් කියවල බලන්නකො.

''මේ දිනවල අපි වමේ බහුජන ව්‍යාපාරයක් ගොඩනැගීම සඳහා කටයුතු කරමින් සිටිනව. ... මේ ක්‍රියාදාමයේ එක් තැනක දී මැතිවරණ කොමසාරිස් වරයා වෙත ගොස් දේශපාලන පක්ෂයක් ලියාපදිංචි කරනව.''

(සේනාධීර ගුණතිලක - ලක්බිම 2011 නොවැ.08 පිටුව 04)

දැන් මේ මොකක්ද වෙන්නෙ. මුලින් කියනව 'අළුත් පක්ෂයක් හදනව' කියල. දවස් 5 කට පස්සෙ කියනව 'නෑ' කියල. මාසයක් ගතවෙන්න කලින් ආයෙ කියනව 'පක්ෂයක් හදනව විතරක් නොවෙයි මැතිවරණ කොමසාරිස් ළඟ ලියාපදිංචිත් කරනව' කියල.

මේව ගැන ආපසු හැරිල බලන කෙනෙක්,

''ඔයගොල්ල මේ යන්නෙ ඉලක්කයක් නැති නන්නත්තාරෙ යන ගමනක් නේද?''
කියල ඇහුවොත් මොකක්ද දෙන උත්තරේ?

ඒ වගේමයි, පක්ෂයේ බලය ඇල්ලීම ගැන මේ අය කියන කතා.

''පක්ෂයේ සිටිමින් බලය අල්ලනවා මිසක් යන්නෙ නෑ. - ජවිපෙ කැරලිකාරී කණ්ඩායම -

''මේ දිනවල රටපුරා පක්ෂ ක්‍රියාකාරිකයින් දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කර ඇතැයි ද කැරලිකාර පාර්ශ්වයේ ප්‍රකාශකයෙක් ලංකාදීපයට ප්‍රකාශ කළේය.

'' සාකච්ඡා මාර්ගයෙන් ප්‍රශ්නය විසඳා ගැනීමේ සියලුම උත්සාහයන් ව්‍යර්ථව ගිය හෙයින් පක්ෂයේ බලය අල්ලා ගැනීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කිරීම හැර වෙනත් පියවරක් නැතැයි ඔහු කීය.''

(ලංකාදීප - 2011.09.26 පිටුව 01)

එහෙම කියපු මේ ගොල්ලො මාස එකහමාරක් යනකොට මෙහෙම කියනව.

'' ගොඩනැගිලි අල්ලගෙන, පක්ෂයෙ නම අරගෙන, නීතිය හමුවට ගිහිල්ල මේ ප්‍රශ්නය විසඳන්න බැහැ.
'' පක්ෂයක නම අත්පත් කර ගැනීම වැදගත් වෙන්නෙ නැහැ.
'' නමක් අල්ල ගත්ත පමණින් අභියෝග ජයගත නොහැකියි.''

(සේනාධීර ගුණතිලක - ලක්බිම - 2011 නොවැ.08 පිටුව 04)

මේ කතාවත් හරියට උඩ පැනල - උඩ පැනල හති වැටිල අන්තිමට මිදි තිත්තයි කියල නරිය කියපු කතාව වගෙයි.

පුබුදු ජයගොඩ දිවයිනට කිව්වේ මෙන්න මෙහෙම.

''අපේ දේශපාලනය, බලය ගන්න දේශපාලනයක් නෙවෙයි. අපේ අරමුණ බලය නොව සමාජ සංවර්ධනයයි.''

(පුබුදු ජයගොඩ - දිවයින 2011.11.08 පිටුව 04)

මේ කියමන, පක්ෂයේ සිටිමින් බලය අල්ලනවා මිසක් යන්නෙ නෑ යි කියන කියමනත් එක්ක කොච්චර පරස්පරද? මේ එක එක්කෙනා තම තමන් ගේ හිතට එන ඒව තමයි කියල තියෙන්නෙ. පොදු ඒකමතිකත්වයක් තිබිලම නෑ. 'මෙහෙම හසරක් නොදැන ගියොත්, කතර මැද අතරමං වෙනවාට සැකයක් නෑ' කියලා සිහි කල්පනා තියන කෙනෙකුට නම් තේරෙන්න ඕන.

'පක්ෂයේ බලය අල්ලන්න ඕන කමක් නෑ කිව්වට, බලය සඳහාමයි සියලු උත්සාහයන් දරල තියෙන්නෙ' කියලා මේ ප්‍රකාශ වලින් යසට තේරෙනවා.

'' පක්ෂයේ අයිතිය හා මූලස්ථානය ඉල්ලා ජවිපෙ කැරලිකාරයෝ අධිකරණයට යති.

'' මෙම නීතිමය කටයුතු සඳහා තමන්ට බාධාවක්ව තිබෙන්නේ මැතිවරණ කොමසාරිස්වරයා වෙත පක්ෂය විසින් යවා ඇති මධ්‍යම කාරක සභා සාමාජිකයින් ගේ නාම ලේඛනය බව කැරලිකාර කණ්ඩායමේ ප්‍රකාශකයෙකු දිවයින ඉරිදා සංග්‍රහයට ප්‍රකාශ කළේය.''

*(ඉරිදා දිවයින - 2011.10.09. මුල් පුවත)*

ඒ මූලස්ථානයේ බලය අල්ලන්න හදපු හැටි. ඒවා ඔක්කොම අසාර්ථකයි.

'' කැස්බෑව කාර්යාලයේ අයිතිය ඉල්ලා ජවිපෙ සහ කැරලිකාරයෝ ගැටෙති.

'' මේ පිළිබඳව පැහැදිලි කළ ජවිපෙ කැස්බෑව ප්‍රා.සභා මන්ත්‍රී ලක්ෂමන් නිපුණආරච්චි මහතා මෙසේ කීය. 1997 වසරේ සිට කටයුතු කරන කාර්යාලයයි මේ. අද උදේ එද්දී අර කණ්ඩායමේ දොළහක් විතර එතන හිටියා. ඒ අය මා හොඳින් දන්නා හඳුනන අය. මම ''ඇයි'' කියා ඇහුවම ''අපි මේක අත්පත් කරගන්න ආවා'' කියා ඔවුන් කීවා.''

*(දිවයින - 2011.11.18 මුල්පිටුව)*

මේ කැස්බෑව කාර්යාලය අල්ලන්න හැදූ හැටි. මේ සියල්ල අසාර්ථක වුනත් ඔවුන් ගේ අරමුණ වුනේ උසාවි ගිහිං හරි බලහත්කාරයෙන් හරි මේවයේ අයිතිය හා බලය ලබා ගන්නයි. ඉතිං කොහොමද, 'අපේ අරමුණ බලය නොවෙයි, ගොඩනැගිලි, පක්ෂයේ නම අත්පත් කරගෙන වැඩක් නෑ' කියන්නෙ? මේව ඔක්කොම අංජබජල් කතා. මේ සියල්ලෙන් හැඟෙන්නෙ මේ අය දෙලොවක් අතර අතරමං වී ඇති හැටියි.

ජවිපෙ නායකත්වය සම්බන්ධයෙනුත් මේ අයගෙ කතා එකි'නෙකාට පරස්පරයි.

'' නායකත්වය මාරු කිරීමට වඩා වැරදි නිවැරදි කරගැනීමයි අවශ්‍ය වන්නෙ.''

*(පුබුදු ජයගොඩ - ලංකාදීප 2011.09.28 පිටුව 18)*

ඒ පුබුදු ජයගොඩ. මෙහෙම කියන්නෙ ඕපාත.

'' අනිවාර්යයෙන්ම නායකත්වය වෙනස්විය යුතුයි.''

*(ඕපාත - ලක්බිම 2011.11.08 පිටුව 04)*

මේ සම්බන්ධයෙන් ජී. කුලරත්නගෙ මතය මේකයි.

'' මේ නායකත්වය අනිවාර්යෙන්ම වෙනස් විය යුතුයි.''

*(ජී. කුලරත්න - ලක්බිම 2011.11.20 පිටුව 10)*

මේ තුන්දෙනාම කැරලිකාර කණ්ඩායමේ අය. හැබැයි තුන්දෙනා ඉන්නෙ මතවාද දෙකක. අර පරමාණුවක් තවත් අණුවලට කැඩිල වෙන් වෙනව වගේ කැරලිකාර කණ්ඩායම ඇතුළෙත් තව තව කණ්ඩායම් තියෙනව වගෙයි. එකට කැවත් බොක්ක වෙනස් කියන්නෙ මෙන්න මේවට.

පුබුදු ජයගොඩ, පුබුදු ජයගොඩටම එරෙහිව යන තවත් අවස්ථාවක් මේ බලන්න.

ජවිපෙ මධ්‍යම කමිටු රැස්වීමට ගොස් ආපසු හැරී ඇවිත් පුබුදු ජයගොඩ, දිවයිනට මෙහෙම කියනව.

'' පරීක්ෂා කරන්න හැදූ නිසා අප ආපසු හැරී ආවා''

*(පුබුදු ජයගොඩ - දිවයින මුල් පිටුව 2011.11.30)*

ඒ පුබුදු ජයගොඩ එදාම ලංකාදීප පුවත් පතට කියන්නෙ මෙහෙමයි.

'' ඇරියුම පිට ජවිපෙ මධ්‍යම කාරක සභා රැස්වීමට ගිය කැරලිකාර පිරිස එළවා දමලා.''

(පුබුදු ජයගොඩ - ලංකාදීප මුල් පිටුව 2011.11.30)

උදේ කියපු එක හවස් වෙනකොට මතක නෑ. දිවයිනට කියපු එක ලංකාදීපෙ එක්ක කතා කරන කොට මතක නෑ. කරකවල ඇතැරියට පස්සෙ පියවි තත්ත්වයට එන්න ටික කාලයක් ගතවෙනව. එතකං දොඩවන්නේ, ඕලව නීලව.

ඔක්කොම වැරදීගෙන යනකොට මේ ගොල්ලො යෝජනා කළේ මහ සමුළුවක් කැඳවන්න කියලයි.

'' ජවිපෙ අර්බුදය විසඳීමට මහ සමුළුවක් කැඳවා සාමාජිකයින්ගෙ මතය විමසන්න.''

(පුබුදු ජයගොඩ - ලංකාදීප 2011.09.27 පුල් පිටුව)

ඊට ජවිපෙ නායකයින් දුන්නු පිළිතුර මෙහෙමයි.

'' විශේෂ සමුළුවකට ජවිපෙ සූදානම්. - සෝමවංශ අමරසිංහ කියයි.
ජනතා විමුක්ති පෙරමුණ විශේෂ සමුළුවක් පැවැත්වීමට අවශ්‍ය නම්, එවැනි සමුළුවක් පැවැත්වීමට පක්ෂය සූදානම් බවත්, පක්ෂයේ මධ්‍යම කාරක සභාව දැනටමත් ඒ සඳහා පූර්ණ කැමැත්ත පළකර ඇති බවත්, එම පක්ෂයේ නායක සෝමවංශ අමරසිංහ මහතා 'ලක්බිම'ට ප්‍රකාශ කළේය.

(ලක්බිම 2011-09-28 මුල් පුවත)

ඒ අනුව, විශේෂ සමුළුවක් කැඳවනු ලැබුවා.

'' ජවිපෙ සමුළුව 01 දා හම්බන්තොට දී - ටිල්වින් සිල්වා කියයි.
පක්ෂයේ ව්‍යවස්ථාවට අනුව, නීත්‍යානුකූලව, අදාල සමුළුව කැඳවා ඇති බවත්, මේ සම්බන්ධයෙන් සියලුම අර්ධකාලීන, පූර්ණකාලීන සාමාජිකයින්ට ලියාපදිංචි තැපෑලෙන් ලිපි යවා තිබෙන බවත් ඔහු කීය. (ලක්බිම 2011. 12. 26)

ඒ වගේම 2011 දෙසැ.26 දින සිංහල, දෙමළ, ඉංග්‍රීසි පුවත්පත්වල ඒ පිළිබඳව නිල දැන්වීම් පළකර තිබුණා. ඒ අතරෙ මෙහෙම පුවතක් පුවත්පත් ගණනාවක පළවුණා.
මේ ලංකාදීප පුවත්පතේ පළවුණ ප්‍රවෘත්තියක්.

'' ජවිපෙ සමුළුවට වාරණයක් ඉල්ලා කැරලි පිලෙන් පෙත්සම් දෙකක්.
උසාවි ඇවිත් කරුණු දක්වන්න සෝමවංශ ඇතුළු 22 කට නොතීසි.''

(ලංකාදීප 2011.12.28)

උසාවියෙන් වාරණ පැනවූයේ නැහැ. සමුළුව පැවැත් වුණා. ඒත් කැරලිකාර කණ්ඩායමේ කිසි කෙනෙක් ඒකට සහභාගි වුනේ නැහැ. අනේ කාලේ වනේ වාසේ කියන්නෙ මෙහෙම ඒවට.

මේව මෙහෙම සිද්ධ වෙද්දී ජවිපෙ දේශපාලන මණ්ඩල සභික ලාල් කාන්ත මෙහෙම කියනව.

'' මාධ්‍ය ප්‍රකාශක මධ්‍යම කාරක සභාවට නවකයෙක්.
ව්‍යවස්ථාව කඩ කළේ කැරලිකාරී කණ්ඩායමයි.''

(ලාල් කාන්ත - දිවයින 2011.09.28 මුල් පිටුව)

'' කැරලිකාර කණ්ඩායමක් නෑ''

(පුබුදු ජයගොඩ - දිවයින 2011.09.28 මුල් පිටුව)

ඊට සතියකට පස්සේ ඕපාත කියන්නෙ මෙහෙම.

'' කැරලිකාර කණ්ඩායමෙන් අළුත් දේශපාලන පක්ෂයක්. - කැරලිකාර කණ්ඩායමේ ඕපාත කියයි.''

(ලංකාදීප 2011.10.05 මුල්පිටුව)

එක කණ්ඩායමක නම් තනි වචනයක් තියෙන්න එපායැ. 'කැරලිකාර කතාව අපි පිළිගන්නෙ නෑ' කියල ඒකමතියකට ආව නං එහෙම කටයුතු කරන්න ඕන. 'ඕන එකක් කියපුදෙං. අපිත් එහෙම ම කියලා දාමු' කියල අදහසකට ආවනං ඒක එහෙම. මෙතන ඒ එකක්වත් නෑ. එළ හරකයි, මී හරකයි එකට ඇඳුවම එළ හරක ඒ පැත්තෙ යනව, මීහරකා මේ පැත්තෙ යනව. මේකෙත් එහෙමයි.

කැරලිකාර කණ්ඩායම ජවිපෙ නායකත්වයට එල්ල කරපු තවත් චෝදනාවක් තමයි ජාතික ප්‍රශ්නයේ දී හරි ස්ථාවරයක් තිබුනෙ නෑ කියන එක.

'ලංකාදීප පුවත්පත සමග 2011.10.09 වැනි දින කරපු සම්මුඛ සාකච්ඡාවේ දී ඕපාත හිටියෙ මෙන්න මේ වගේ ස්ථාවරයක.

'' ප්‍රශ්නයඃ- ජවිපෙ සියුම්ව ජාතිවාදී පදනමකින් කටයුතු කරනව නේද?

පිළිතුරඃ- ඇත්තටම නැහැ.

(ඕපාත - 'ජවිපෙ බලය අල්ලන්න කුමන්ත්‍රණයක් නෑ' හිසින් ලංකාදීප සමග 2011.10.09 දා කළ සංවාදය පිටුව 08)

මෙහෙම කියපු ඕපාත එදාම 'රිවිර' පුවත්පත සමග කළ සම්මුඛ සාකච්ඡාවේදී කියන්නෙ මොනවද කියල බලන්නකො.

'' ධනපති ආණ්ඩු වලට එකතු වී ජාතිවාදී මඩ ගොහොරුවකට වැටී, එල්.ටී.ටී.ඊ. ය පරාද කරන්න අපි ගිය ගමන ගැන ආපසු හැරී බැලීමක් අපට තියෙනව.''

(ඕපාත - අවලාදවලින් අපේ අරගලය යට කරන්න බෑ' හිසින් රිවිර සමග 2011.10.09 දා කළ සාකච්ඡාව පිටුව 11)

ලංකාදීප පුවත්පතට එකක් කියන ඕපාත එදාම රිවිර පුවත්පතට කියන්නේ තව කතාවක්. මේකෙන් හරි පැහැදිලිව පෙනෙන්නේ දේශපාලන ස්ථාවරයක හරියට පිහිටලා ඉන්න බැරිකමයි. එක් මාධ්‍යවේදියෙකු වට කරලා ප්‍රශ්නෙ අහනකොට ඒකට දෙන උත්තරේට හාත්පසින්ම වෙනස් උත්තරයක් වෙනත් පුවත්පතක මාධ්‍යවේදියා අහන ප්‍රශ්නෙට දෙන උත්තරේ.

'' ජාතික ප්‍රශ්නයේ දී සැබෑ තැන ඉන්න අපට නොහැකි වුණා. ... ජාතික ගැටළුවෙදි අපි ජාතිවාදී වුනා. ... වමේ ව්‍යාපාරයක් ජාති වාදීවීම සමාව දිය නොහැකි වරදක්. ...''

(ඕපාත - ලක්බිම 2011.11.08 පිටුව 04)

'' ඇත්තටම කවදාවත් අපේ පක්ෂයෙ ජාතිවාදයක් තිබ්බෙ නැහැ. දෙමළද, සිංහලද, මුස්ලිම්ද කියලා ජවිපෙට ප්‍රශ්නයක් තිබ්බෙ නැහැ.''

(ඕපාත-ලංකාදීප 2011.10.05 පිටුව 18)

ඕපාතගේ මේ පරස්පර ප්‍රකාශ වලින් කොයිකද අපි බාරගන්න ඕන? එහෙම ප්‍රශ්නයක් මතුවෙනව. ඕපාතට උතුර දකුණ මාරු වෙලාද කියල හිතෙන්නෙ මේ වෙලාවට.

ලංකාවේ ජාතික ගැටළුව සම්බන්ධයෙන් අංග සම්පූර්ණ විද්‍යාත්මක විග්‍රහයක් 1985 දී ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටුවට රෝහණ විජේවීරයන් විසින් ඉදිරිපත් කරනු ලැබුවා. පසුව 'දෙමළ ඊළාම් අරගලයට විසඳුම කුමක්ද?' නමින් එම ලියවිල්ල ග්‍රන්ථයක් ලෙස එළි දක්වනු ලැබුවා. 'බලය බෙදීම යනු දෙමළ ත්‍රස්තවාදී නායකයින්ට දෙන කප්පමක්' හැටියටයි විජේවීරයන් හැඳින්වූවේ. බලය බෙදීම ගැන මෙන්න පුබුදු ජයගොඩ කියන කතාව.

> ''බලය බෙදීම කියන එක ගැන වියුක්තව උත්තර දෙන්න අමාරුයි. නමුත් අපි මූලධර්මයක් ලෙස බලය විමධ්‍යගත කරණයට එකඟයි.''
>
> *(පුබුදු ජයගොඩ - රාවය 2011.12.11 සංවාදයේදී)*

පළාත් සභාවලට ඉඩම් බලතල හා පොලිස් බලතල ලබාදීම සම්බන්ධයෙන් ඔහුගේ කට හඬින්ම BBC ගුවන් විදුලියේ සංදේශය වැඩ සටහනට පුබුදු ජයගොඩ මෙහෙම කියනව.

> ''දෙමළ ජනතාව ඉල්ලා සිටින්නේ නම් උතුරේ ජනතාවට ඉඩම් සහ පොලිස් බලතල ලබාදීමට අපි විරුද්ධ නැහැ.''
>
> *(BBC ගුවන් විදුලියේ සංදේශය වැඩසටහනට 2012 ජනවාරි 22 දින පුබුදු ජයගොඩ කරන ලද ප්‍රකාශයේ හඬ පටයෙන්)*

ඒ පුබුදු ජයගොඩම ලක්බිම පුවත්පතට මෙහෙම කියනව.

> '' BBC කියන්නේ බොරු. මම එහෙම කිව්වේ නැහැ'' කියල.
>
> *(ලක්බිම - 2012 ජනවාරි 27)*

ඔහුගේ හඬ පටිය හරහා ඔහු කියන දේ ද නැත්නම් ලක්බිම පුවත්පතට ඔහු කියන කතාවද අපි පිළිගන්න ඕන? මොනව වුණත් ඕන කෙනෙකුට හිතෙන්නේ ඔහුගේ හඬ පටිය තමයි, වඩා ප්‍රබල සාක්ෂිය.
එහෙම බලන කොට මොකක්ද වෙමින් යන්නේ? 'ජාතික ගැටලුව සම්බන්ධයෙන් රෝහණ විජේවීරයන් කරපු මාක්ස් - ලෙනින්වාදී විද්‍යාත්මක විග්‍රහයෙන් පිට පැනල නේද මේ යන්නේ? 'ඕන කෙනෙකුට එහෙම හිතෙනව. හැබැයි රෝහණ විජේවීර අතැරල යන්නත් මේ අයට බැරුව තියෙනව. මොකක්ද හේතුව, ජවිපෙ අධ්‍යාත්මික නායකයා වගේම හැම පැත්තෙන්ම ජවිපෙට ජවය දුන්න එහි නිර්මාතෘ වරයා රෝහණ විජේවීරයි. 'ජවිපෙ කියන්නේ රෝහණ විජේවීරගේ පක්ෂය'. එහෙම තමයි සාමාන්‍ය ජනතාව හිතන්නේ. ඒ නිසා ඉන් බැහැර වූ බව කියල හරි - පෙන්නල හරි කිසිවෙකුට පැවැත්මක් නැහැ. ඒ නිසයි ' රෝහණ විජේවීරගේ අප රක්නා උරුමය' නමින්, ඒ අය දේශන ගණනාවක් පැවැත්වූවේ. ඒ මාතෘකාව යටතේ ඕපාත, පුබුදු ජයගොඩ, චමීර කොස්වත්ත, අජිත් කුමාර වැනි කීප දෙනෙක්ම දේශන පැවැත්වුවා. ඒ හැම කෙනෙක්ම කිව්වේ, රෝහණ විජේවීරයන් ගේ නිවැරදි භාවය ගැන. මේ බලන්න.

> '' රෝහණ විජේවීර බෙදුම්වාදයට විරුද්ධ වුණා. බෙදුම්වාදය පරාජය කොට ජාතික සමගිය ගොඩනැඟිය යුතු බව, රෝහණ විජේවීර කීවා. ජාතික සමගිය සඳහා සමානාත්මතාවය අවශ්‍ය බව ඔහු කීවා. '
>
> *(අජිත් කුමාර-දිවයින 2011 නොවැ. 07)*

ඒ අජිත් කුමාර. පුබුදු ජයගොඩ බෙදුම්වාදය නොහොත් බලය බෙදීමට එකඟ වෙනවා. ඒත් බෙදුම්වාදය පරාජය කොට ජාතික සමගිය ගොඩනැගිය යුතු යැයි කිවූ විජේවීරයන් අගේ කරනවා.

> '' රෝහණ විජේවීර අතහැරලා ලංකාවේ වමේ ව්‍යාපාරය ගැන කතා කරන්න බැහැ. ''
>
> *(පුබුදු ජයගොඩ- දිවයින 2011 නොවැ. 08 පිටුව 14)*

පුබුදු ජයගොඩ එහෙමයි' රෝහණ විජේවීර ගේ ප්‍රතිරූපය ඉස්මතු කළේ. එයාට විජේවීර අත් අරින්නත් බෑ. බලය බෙදීමට එකඟ වෙන්නත් ඕන. ඕපාත ත් ඒ මාතෘකාව යටතෙම ගාල්ලෙදී දේශනයක් පැවැත්වුවා. එයාත් විජේවීර ගේ ප්‍රතිරූපය ඉස්මතු කළා. හැබැයි විජේවීර ගේ ප්‍රතිරූපය උස්සලා තම කණ්ඩායමේ මතය ඉස්සරහට ගෙනියන්න බැහැ. මොකක්ද මේ කණ්ඩායමේ මතය?

'' අපි මූලධර්මයක් ලෙස බලය විමධ්‍යගතකරණයට එකඟයි.''

(පුබුදු ජයගොඩ 2011 දෙසැ. 11 රාවය පුවත් පතට කළ ප්‍රකාශය)

'' දෙමළ ජනතාව ඉල්ලා සිටින්නේ නම්, උතුරේ ජනතාවට ඉඩම් බලතල සහ පොලිස් බලතල ලබාදීමට අපි විරුද්ධ නැහැ ''

(පුබුදු ජයගොඩ -BBC ගුවන් විදුලියේ සංදේශය වැඩසටහනට කළ ප්‍රකාශයේ හඬ පටය. )

මේ ප්‍රකාශ දෙකම කළේ පුබුදු ජයගොඩ. කැරලිකාර කණ්ඩායමේ දේශපාලන කටයුතු සම්බන්ධ ලේකම්. 'මේ ප්‍රකාශ එක්ක තම කණ්ඩායම එකඟවන්නේ නැහැ' කියල, ඕපාත හෝ එම කණ්ඩායමේ වෙනත් නායකයකු හෝ කියල නැහැ. එහෙනම් ඒ අදහස එම කණ්ඩායමේ මතයම බව සළකන්න සිද්ධ වෙනව.
'පුබුදු ජයගොඩ හරහා මේ ප්‍රකාශයන් කරවා ජනතා ප්‍රතිචාර කොහොමද කියලා මුට්ටිය දමලා බැලීම ද මේ කරන්නේ 'කියල හිතන්නත් පුලුවන්. එක පාරටම ගහෙන් ගෙඩි එන්න වගේ රෝහණ විජේවීරගේ මතයට අංශක 180 ක් වෙනස් මතයක් ගෙනත් දමන්නත් බැහැනේ. දැන් මොකද වෙන්නේ?

'' ඔහු අපට කිව්වේ රෝහණ සහෝදරයා පසුකර යන මිනිස්සු හදන්න කියලා''

(ජවිපෙ බලය අල්ලන්න කුමන්ත්‍රණ නෑ- හිසින් ඕපාත ලංකාදීප පුවත්පතට කරන ලද ප්‍රකාශය- 2011/10/09 දින පිටුව 08)

'' අපි රෝහණ විජේවීර සහෝදරයා දේශපාලන වශයෙන් නැවත කියවීමේ සමාජ කතිකාවක් ආරම්භ කළා. ඉක්මවා යන මිනිසුන් ගොඩනැගීමේ ව්‍යාපාරයක් අපි අරඹා තිබෙනවා. ''

(ඕපාත- ලක්බිම-2011/12/08 පිටුව 04)

මේ '' පසුකර යන මිනිසුන්, ඉක්මවා යන' මිනිසුන් ආදී වශයෙන් වහෙන් ඔරෝ භාෂාවෙන් කියන්න හදන්නේ මොකක්ද? එහෙම ප්‍රශ්නයක් බරපතල විදියට මතු වෙනවා. ''
ඒ අනුව බැලුවම රෝහණ විජේවීර සමග එකට යන අය ගෝලයින් හෝ අනුගාමිකයින් වෙනව වගේම ඉක්මවා යන හෝ පසුකර යන්නන් සමාජ සංවර්ධනයේ නියම පෙරටුගාමීන් වෙන්න ඕන. මේ කියන්න හදන්නේ ඒක වෙන්න ඇති. හැබැයි ඕපාතගේ මේ ප්‍රකාශයත් එක්ක බලමු.

'' අපේ අරගලය ජාතික ස්වරූපයකට කරන්න යෑම වරද ආරම්භයයි. රෝහණ විජේවීර සහෝදරයා තුළ වුණත් අඩුපාඩු තිබුණා. මේ අරගලය පිළිබඳ වැරදුණු තැන් ජනතාව දැන ගත යුතුයි. ''

(ඕපාත ලංකාදීප- 2011/11/05)

'පසුකර යන මිනිසුන් ', ' ඉක්මවා යන මිනිසුන් ' ගැන කිව්වෙත් පුබුදු ජයගොඩ ලවා මුට්ටිය දමා බැලුවෙත් මෙන්න මෙතෙන්ට එන්න ද කියලා කෙනෙකුට සැකයක් මතු වෙනවා නම් ඒක සාධාරණයි. රෝහණ විජේවීරයන් පසුකර යන්නේ, 180° ක් අනිත් පැත්තට ද කියල හිතුණත් වැරදි නැහැ. පත්තර කාරයෝ ඒ පැත්තට මේ පැත්තට කරකෝලා අහන ප්‍රශ්නවලට ඇතුළේ එකක් කියාගෙන තවත් එකක් කියන්න ගියාම මාර විදියට අමාරුවේ වැටෙනව. එහෙම වෙලා තමයි . 'අර අපි හංගපු බඩුවේ මුල ඇවරිය ඉදිල' වගේ කතා කියවෙන්නේ. හංගපු බඩුව මොකක්ද කියල නොකිව්වට 'මුල ඇවරිය' කියල කිව්වට පස්සේ බඩුව මොකක්ද කියල ඕනම පොඩි එකෙක් දන්නව.

ජවිපෙ බහුතර බලය තමන්ට තිබුණ බව කැරලිකාර කණ්ඩායම කිව්ව.

'' ජවිපෙ නායකයින්ට හිමි දේවාලය පමණයි. එහි සියලු දෙවිවරු සිටින්නේ අප සමගයි. ''

(ජවිපෙ කැරලිකාර කණ්ඩායමේ - චමීර කොස්වත්ත -2011 නොවැ. 14 දිවයින -පිටුව 08. )

ඒ, 2011 නොවැ. 13 දින සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගණයෙදි. 2011 දෙසැ. 01 වැනිදා රාජගිරිය සිංහ සමාජ ශාලාවේ

දී පුවත් පත් සාකච්ඡාවක් පවත්වමින් මෙහෙම කියනවා.

''පක්ෂයේ බලය අල්ලන්න සියලු හැකියාවන් අපිට තිබුණා. නමුත් ජවිපෙ නිලධාරී සුළුතරය භාවිත කරන වංචනික වාමවාදී නොවන ක්‍රියා කලාපය හෙළි කිරීමටයි, අපට වුවමනා වුණේ. බහුතර සාමාජිකයින්, සංවිධාන ශක්තිය අප එක්කයි. ''

*(චමීර කොස්වත්ත-රිවිර-2012 ජනවාරි 02- පිටුව 13)*

මේ අතර ඕපාත කියන්නේ මෙහෙමයි.

'' දෙදහසෙන් පස්සේ පරණ වම තිබුණ තැනට ජවිපෙ වැටුණා. වමේ බලයක් වෙනුවෙන් අරගල කර අප පරාජයට පත්වෙනවා. ''

*(ඕපාත- ලංකාදීප 2012 නොවැ. 05)*

චමීර කියන විදියට බලය අල්ලන්න සියලු හැකියාව තිබුණ නම් බහුතර සාමාජිකයින්, සංවිධාන ශක්තිය ඔවුන්ට තිබුණ නම්, වමේ බලයක් වෙනුවෙන් අරගල කරල ඒ අය පරාජයට පත්වුණා යැයි ඕපාත කියන්නේ ඇයි? මේ කතා දෙක පරස්පර කතා දෙකක් නෙ. එක්කෝ චමීර කියන විදියට ලොකු බලයක් ඒ ගොල්ලන්ට තිබුණා කියන එක බොරු වෙන්න ඕන. නැත්නම් වමේ බලයක් වෙනුවෙන් තමන් කරපු අරගලය පරාජය වුණා කියන එක බොරු වෙන්න ඕන. අමු කැවුණොත් මොළේ කචල් වෙනවා කියල කතාවක් තියෙනවා. අත්තන ඇට කැවුණත් ඒ ආනිසංසයමයි. මේ දෙකම එකට කැවුණොත් පිස්සු ඩබල් වෙනව. මේ ගොල්ලන්ට වෙලා තියෙන්නේ එහෙම අලකලංචියක් කියලා මේවා අහන අයට හිතෙන්න ඉඩ තියෙනවා.
මේ කතා දෙකම නැතුව 'වමේ බලයක් වෙනුවෙන් නෙවෙයි. පක්ෂයේ බලය අල්ලනයි මේ අය කුමන්ත්‍රණය කළේ' කියල ජවිපෙන් මොවුන්ට එල්ල කරන චෝදනාවේ ඇත්තක් තියෙනවයි කියල මේ අච්චස්සේ ඕන කෙනෙකුට හිතෙනවා.

මේ සම්බන්ධයෙන් අනුර කුමාර දිසානායක දිවයින ඉරිදා සංග්‍රහයට කියල තියෙන්නේ මොනවද බලමු.

'' අපේ පක්ෂය, ඉහළ මණ්ඩලවල පොදු එකඟතාවයෙන් හෝ බහුතර එකඟතාවයෙන් තමයි තීන්දු තීරණ ගන්නේ. ඒ නිසා ඉතිහාසයේ තීන්දු තීරණ හෝ ජයග්‍රහණ පසුබෑම් පිළිබඳව තියෙන්නේ පොදු වගකීමක්. මෙතැන තිබෙන ඉතාම හාස්‍යජනක හා කණගාටුදායකම දේ තමයි, ඔවුන් පක්ෂයේ බහුතරය යැයි කියනවා. බලපෑම් කණ්ඩායමයි කියනවා. අභ්‍යන්තරයේ මහා කාර්යභාරයක් කරපු අයයි, කියනවා. හැබැයි ඉතිහාසයේ තීන්දු තීරණවලට ඔවුන් හවුල් නෑ කියනවා. ඒ නිසාම ඔවුන්ගේ දේශපාලනයේ පදනම වී තිබෙන්නේ ඉතාම පහත් කුහකත්වයක්.''

*(අනුර කුමාර දිසානායක-ඉරිදා දිවයින-2011/11/06 -දේශපාලන -පිටුව 05)*

ඒ කියන කතාව, පුබුදු ජයගොඩලා විසින්ම ඔප්පු කරනව. මේ බලන්න.

'ජනතා විමුක්ති පෙරමුණ' දේශපාලන උපාය මාර්ග තෝරා ගත්තේ මාක්ස් ලෙනින් වාදී ස්ථාවරය පැත්තකට දාල. **ඔවුන්** උපාය මාර්ග තෝරන කොට කටයුතු කර තිබෙන්නේ දැඩි ප්‍රායෝගිකවාදී, උපයෝගීතාවාදී පදනමකින්.

'' මා අදහස් කරන්නේ මාක්ස් ලෙනින් වාදී පක්ෂයක් හැටියට **ඔවුන්** ධනවාදයට ගොදුරු වූ බවයි. මෙහෙම ධනවාදී ප්‍රපාතයක ඇද වැටීමත් එක්කයි **ඔවුන්** පසුගිය කාලේ පංති සහයෝගීතා වාදයකට ගියේ''

*(පුබුදු ජයගොඩ ලක්බිම 2011.12.11 පිටුව 10 )*

මේ ඔවුන් - ඔවුන් යැයි පුන පුනා කියන්නේ තමන් මේ පක්ෂයේ වගකිවයුතු මණ්ඩලවල සිටි බව පවා අමතක කරමින්. හැබැයි, ඒ වගකිවයුතු මණ්ඩල වල තමන් දරපු වගකීම් සියල්ල අවසන් වෙනවා, එතැනින් එලියට ආවට පස්සෙ. තමන් ඇතුළු කණ්ඩායම එලියට ආව කියල පුබුදු ජයගොඩම පිළිගන්නව. මේ බලන්න,

''සටන් නොකළා නෙවෙයි සටන් කළා. දිගටම පක්ෂය ඇතුලේ අරගල කළා. නමුත් ගමන් මග වෙනස් කරන්න අපට බැරිවුනා. බැරිවූ තැන තමයි අපි එළියට ආවේ. .....''

(පුබුදු ජයගොඩ ලක්බිම 2011.12.11 පිටුව 10)

එහෙම එළියට ඇවිත් කොහොමද, පක්ෂයේ දරපු තනතුරු නාමයෙන් තවදුරටත් පෙනී හිටින්නේ? ඒත් 'නව ලිබරල් ධනවාදයේ දෙවැනි ඉනිම' නමින් කොළඹ මහජන පුස්තකාල ශාලාවේ පුබුදු ජයගොඩ පැවැත්වූ දේශනයේ පෝස්ටර්, බැනර්, කටවුට් ප්‍රදර්ශනය කළෙ 'පුබුදු ජයගොඩ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සාමාජික' යනුවෙනුයි.

''අන්තගාමී වමෙන් මිදී සැබෑ වාමාංශික ව්‍යාපාරයක් අළුතින් ආරම්භ කළ යුතුයි. - ජවිපෙ දේශපාලන මණ්ඩල සභික පුබුදු ජයගොඩ''

( ලක්බිම 2011.09.29 පිටුව 05)

තමන් වගකීම් දරපු කාලේ ගත්තු තීන්දු තීරණ සියල්ල 'ඔවුන්' ගෙ (ජවිපෙ) කියලයි කියන්නේ. හැබැයි එළියට ආවට පස්සෙත් කලින් දරපු තනතුරු නාම ඒ විදියටම පාවිච්චි කරනවා. පුබුදු ජයගොඩ 2011-09-28 වන දින මෙහෙම කියනවා.

''ජනතා විමුක්ති පෙරමුණ තුල අප්‍රසිද්ධියේ කටයුතු කරන බොහෝ දෙනෙක් ඉන්නවා. පක්ෂයට ඔවුන් ඉතා වටිනා නායකයින් දේශපාලන මණ්ඩල සාමාජිකයින් වන මම වත් නොදන්න නායකයින් පක්ෂය තුල ඉන්නවා.''

(පුබුදු ජයගොඩ, ලංකාදීප - 2011-09-28 පිටුව 18)

එක පැත්තකින් ඔහු කියනවා 'තමන් මේ වන විටත් දේශපාලන මණ්ඩල සාමාජිකයෙක් කියලා.

''දේශපාලන මණ්ඩලයෙන් මමත්, දිමුතු ආටිගල සොයුරියත්, වරුණ දීප්ත රාජපක්ෂ සහෝදයාවත් ඉවත් කළ බවට මාධ්‍ය වාර්තා පළ වී තිබේ. හැබැයි මේ වනතුරුත් මට දන්වල නැහැ. ඒ නිසා මම තවමත් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සාමාජිකයෙක්. ''

(පුබුදු ජයගොඩ- ලංකාදීප- 2011-09-28, පිටුව 18)

2011-02-10 වන දින පවත්වපු ජවිපෙ සමුළුවෙන් ඔහු මධ්‍යම කමිටුවට තේරී පත් වුණාට පස්සේ ඒ පත්වීම ගැන ජවිපෙන් පත්වීම් ලියුම් භාර දුන්නෙ නැහැනෙ. ඒ එක්කම දේශපාලන මණ්ඩලේට තෝරා ගත්තට පස්සේ ඒ පත්වීමත් ලිඛිතව දන්වලා නැහැනෙ. ඒ වගේම, එම දේශපාලන මණ්ඩලේ විසුරුවා හැර අළුතින් දේශපාලන මණ්ඩලයක් පත් කරන්න මධ්‍යම කමිටුවේ පවත්වපු ඡන්දෙන් පුබුදු ජයගොඩ ඇතුළු 4 දෙනෙක් අවශ්‍ය ඡන්ද ප්‍රමාණය නොලැබී දේශපාලන මණ්ඩලෙන් හැලුනට පස්සේ ඒ කාටවත් තනතුරු අහිමි වූ බව දන්වා ජවිපෙන් ලිපි භාර දීලත් නෑ, එහෙම ලිපි භාර දෙන්න ඕනත් නෑ. ජවිපෙ මධ්‍යම කමිටුව විසින් උපරිම ප්‍රජාතන්ත්‍රවාදය යටතේ පවත්වපු රහස් ඡන්දෙනුයි, අවශ්‍ය ඡන්ද ප්‍රමාණය ලබා ගන්න ඔවුන් අසමත් වුනේ. ඒත් තවදුරටත් 'ජවිපෙ දේශපාලන මණ්ඩල සභික' කියන තනතුරු නාමය පාවිච්චි කරනවා. මොනතරම් ලැජ්ජ නැති වැඩක්ද ?

ඒ විතරක් නෙමෙයි. 2011-09-28 ලංකාදීප පත්තරේට කරපු ප්‍රකාශය නැවතත් බලන්නකො. 'දේශපාලන මණ්ඩල සාමාජිකයෙකු වන මමවත් නොදන්න නායකයින් පක්ෂය තුල ඉන්නවා කිව්වම මේක මොනතරම් කැත පාවා දීමක්ද කියලා හිතන්න. 1971, 88 - 89 අරගල වලදී පක්ෂය ගැන තොරතුරු අහලා කියතෙන් කපලා දෙපළු කරද්දි, නියපොතු ගලවද්දි, ඇස් උගුල්ලද්දී, කපලා කොටලා වෙඩි තියලා පුළුස්සලා මරද්දි, කිසිදු තොරතුරක් සතුරාට නොදී, එවැනි අරමුණින් එකදු කෙල පොදක් නොහෙලා තම ජීවිත පූජා කරපු සහෝදරවරුන් එක්ක බැලුවාම පුබුදු ජයගොඩගෙ මේ ප්‍රකාශ කොතරම් කැත නින්දිත පාවාදීම්ද ? වධ බන්ධනයට ලක්ව වේදනාව දරාගත නොහැකිව කළ ප්‍රකාශ නම් තව සමාව ලැබෙනවා. ඒත් මේවා වේදනාවෙන් නොව, වෛරයෙන් කරන ප්‍රකාශ බව ඉතා පැහැදිළියි.

ඔවුන්ම පිළිගන්නා විදියට ඔවුන් ජවිපෙ වෙනුවෙන් ලොකු කාර්යභාරයක් ඉටු කරපු අය නම්, අද ඔවුන් මේ

වගේ තැනකට ඇද වැටෙන්න හේතු මොනවාදැයි ප්‍රශ්නයක් මතුවෙනවා. මේ වගේ තත්ත්වයන් අද ඊයේ නෙමෙයි, මාක්ස්, එංගල්ස්, ලෙනින් වැනි කොමියුනිස්ට් වාදී ගුරුවරුන් ගේ වකවානුවලදී පවා තිබූ බවත් මේ ජාතියෙම බඩු ඒ කාල වලත් හිටි බවත් ඉතිහාසයෙන් පෙනෙනවා. මේ බලන්න ලෙනින් ඒ ගැන කියපු වචන කීපය.

''අති උදාරත්වයේ සිට තකතීරු කම දක්වා ඇත්තේ එක් පියවරක් පමණි''. ලෙනින්

එදා ඒ ගොල්ලන්ට වගේම මෙදා මේ ගොල්ලන්ටත් ඒක එහෙමම වලංගුයි. ඉතින් තව මොනවද ඒ ගැන කියන්න තියෙන්නේ ?

කොහොම හරි මේ අය ජවිපෙන් අයින් වුනා කියමු. ඒ ගොල්ලෝ අයින් වෙන්න ඔන්න මෙන්න කියලා තියෙද්දී ජවිපෙ ගැන කිව්වේ මෙහෙමයි.

''කැලැන්ඩරේ පුරුද්දට මාස දින වෙන් කර දේශපාලනය පවත්වාගෙන යෑමේ භාවිතය අප වෙනස් කළයුතුයි''

*(චමීර කොස්වත්ත දිවයින 2011.10.27 පිටුව 16)*

ඒ, ජවිපෙට ඒ ගොල්ලෝ කරන චෝදනාව. දැන් මේ අය මොනවද කරන්නෙ? ජවිපෙ සමාජවාදය වෙනුවෙන් අරගල කරන්නේ නැහැ කියලා, තමන් ගේ නම දාගත්තා 'ජන අරගල'කියලා.

බඩුමිල වැඩි වුණා කෝ ජන අරගල ? තෙල් මිල වැඩි වුණා කෝ ජනඅරගල ? බස් ගාස්තු වැඩි වුණා කෝ ජනඅරගල ? ජනතාව හාමතේ වැටෙනව කෝ ජන අරගල ?

නිකං බොරුවට කට පුවානං කෙලිනව විතරයි. වැඩ වලින් ඒ මොකුත් නෑ. පුස්ස බින්දා වගේ. පටු අරමුණු ඇතුව, කුමන්ත්‍රණ කාරී විදියට පක්ෂයේ බලය අල්ලගෙන 'බලය බෙදීම, ස්වයං තීරණ අයිතිය දීම' වගේ දිසාවකට ජවිපෙ ඇදගෙන යන්න හීන දැකපු අවස්ථාවාදී රංචුවට හොඳම තැන - ගැලපෙනම තැන ජන අරගල නඩේම තමයි. ඒත් මේකෙන් අතරමං වෙන පිරිසක් ඉන්නවා. ඒ අය අවංකව ම සමාජවාදය අපේක්ෂා කළ අය. නඩේ ගුරාල කිව්ව '' ශිෂ්‍ය අංශයත් අපේ අතේ, මධ්‍යම කමිටුවේ වැඩිදෙනා ශිෂ්‍ය අංශයෙන් ගියපු අය නිසා ඒකත් අපේ අතේ. දිස්ත්‍රික් සංවිධායකයෝ ඉන්නේ ශිෂ්‍ය අංශයෙන් දමපු අය. ඒ ටිකත් අපේ අතේ. පක්ෂ මූල්ස්ථානයේ වැඩකරන 30 න් 27 අපේ. කිසිදේකට බයවෙන්න එපා. අපිත් එක්ක එකතු වෙන්න.'' කියල. අඩු දේශපාලන අත්දැකීම් තියෙන අය මේ චාටු බහට රැවටුණා. ඒ මදිවට ජනමාධ්‍ය උන්නැහෙලටත් ඒ ඇති වෙච්චි තත්ත්වය බොර දියේ මාළු බෑමක් වුණා. සමහර පුවත් පත්, තොරතුරු අල්ලෙ පැලකෙරුව.

'' අවසන් අරගලයට කොළඹදී දැවැන්ත සම්මේලනයක් !
කැරලිකාර කණ්ඩායම ජවිපෙ බලය අල්ලයි.''

ජනතා විමුක්ති පෙරමුණේ බලය මේ වන විට 90% ක් පමණ තමන් විසින් අල්ලාගෙන ඇතැයි කැරළිකාර කණ්ඩායමේ ප්‍රකාශකයකු දිවයින ඉරිදා සංග්‍රහයට ප්‍රකාශ කළේය.............''

*( ඉරිදා දිවයින 2011.10.16 ප්‍රධාන ප්‍රවෘත්තිය.)*

කැපකිරීම් කරපු අවංක ක්‍රියා කාරිකයින් පිරිසක් මේ සෝබන කථා වලින් පෙන්නපු මිරිගුවට රැවටුණා. ඒ අය විතරක් නෙවෙයි මේ නඩේ ලොක්කොත් ඒවයින් ස්වයං මෝහනයට පත්වුණා. ඒ අයට වුනෙත් අර නස්රුදීන්ට වෙච්චි දේම තමයි.

නස්රුදීන් කියන්නේ කෙනෙක් බොරුවෙන් රවටන්න රුසිය. එක දවසක් මිනිහ ඇවිදගෙන යනකොට කොල්ලො කට්ටියක් රංචු ගැහිල ඉන්නව. නස්රුදීන් මෙහෙම කියනව 'ඇයි ළමයිනේ දන්නැද්ද අර සුල්තාන්ගෙ පැලස් එක ළඟ තොග ගාණෙ බඩු බෙදන දන්සලක් තියෙනව, යන්නෙ නැද්ද?' කොල්ලෝ කිව්වා 'පච

නොකෙළා පලයං යන්න මිනිහෝ' කියලා. 'බොරු නම් ඉතින් උඹලා හිටපල්ලා මම ගෝනියක් අරං එන්න ගෙදර යනවා' කියලා නස්රුදීන් කිව්වා. කොල්ලන්ට ඒත් සැකයි. එකෙක් නැගිට්ටා. තව එකෙක් නැගිට්ටා. දැන් ඔහොම කට්ටියම හංදිය දිහාවට යනවා. එක එකා වේගේ වැඩි කරනව මැරතන් වේගයෙන් පටන් ගෙන දැන් දකින දකින එවුනුත් මීටර් 100 වේගෙන් දුවනව. මේ දිවිල්ල දැකල නස්රුදීන්ටත් හිතුනා මුං දුවන දිවිල්ලේ හැටියට ඇත්තටම බඩු බෙදනව ඇති කියලා. නස්රුදීනුත් උන්ගෙ පස්සේ මීටර් 100 දුවන්න පටන් ගත්ත. ඔන්න කතාව. මුංදැලාටත් වුණේ ඕක තමයි. ඉස්සෙල්ලා තමන් ම ටිකක් පිම්බුනා. ජනමාධ්‍ය වලින් හොඳටම පිම්බුවා. බැලුම් බෝලයක් වුනත් වැඩියෙන් පුම්බපු හැටියේ එක්කෝ ගුරුත්වාකර්ෂණයෙන් මිදිලා උඩින් යන්න පටන් ගන්නවා, නැත්නම් පුපුරනවා. මේ ගොල්ලෝ දැන් උඩින් යන්නේ. පුපුරන අවස්ථාව එන්නෙ ඉදිරියෙදියි.

සමහර වැඩ ඒ ගොල්ලො කරපුවාම හොඳයි වෙනත් කෙනෙක් කළොත් වැරදියි. හොඳම උදාහරණය සරත් ෆොන්සේකා සම්බන්ධ ස්ථාවරය. ඒ අය දිගින් දිගටම ජවිපෙට චෝදනා කෙරුවේ 'සරත් ෆොන්සේකා ධනපති හමුදාවක හමුදාපති වරයෙක්. එහෙම කෙනෙක් එක්ක සන්ධාන ගැහුවා. එහෙම කෙනෙක් ජනාධිපති කරන්න යූඇන්පී යත් එක්ක එක වේදිකාවට නැග්ගා. සරත් ෆොන්සේකා බලන්න උදේ හවස හිර ගෙදරට යනවා. එයාව එලියට අරගෙන ජවිපෙ ආයෙත් සන්ධානෙට ගැට ගහන්නයි හදන්නේ ' කියලා. හැබැයි දැන් ඒගොල්ලො මොනවදෙ සරත් ෆොන්සේකා ගැන කියන්නේ ?

''සරත් ෆොන්සේකා ඇතුළු දේශපාලන සිරකරුවන් වහා නිදහස් කරනු''

*(ජන අරගල ව්‍යාපාරෙ පෝස්ටරයෙන්)*

''සරත් ෆොන්සේකා ඇතුළු දේශපාලන සිර කරුවන් නිදහස් කරන්න - ජන අරගල ව්‍යාපාරය. සරත් ෆොන්සේකා මහතා ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී දේශපාලනයේ සංකේතයක් බවට පත්ව ඇතැයිද ඒ නිසාම ඔහු ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී දේශපාලනය අවසන් කර ගැනීමේ සංකේතය බවට පත් කර ගත යුතු යැයිද, එම ව්‍යාපාරයේ ජාතික සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් කුමාර මහතා පැවසීය''

*(ජන අරගල ව්‍යාපාරයේ වෙබ් අඩවිය 2012-02-06 වෙනි සඳුදා*

ජවිපෙට එරෙහි විවේචනයයි, ජන අරගල ක්‍රියා පිළිවෙතයි ගලප ලා බලන්නකො. මේ බලන්නකෝ ඒ ගොල්ලෝ දේශපාලනිකව ඉන්න තැන කොතැනකද කියලා. ජන අරගල ව්‍යාපාරයේ දේශපාලන අංශ ප්‍රධානී පුබුදු ජයගොඩ යුක්තිය වෙබ් අඩවිය හා සංවාදයට එක්වෙමින්,

''අපේ පක්ෂය මෙහෙයවන පිරිසක් ඉන්නවා වගේම පක්ෂ සාමාජිකයොත් ඉන්නවා.''

(කලින් කිව්වේ අපි පක්ෂයක් හදන්නෑ කියල)

'' ජන අරගල ව්‍යාපාරයට නිශ්චිත දේශපාලන මතවාදයක් නෑ. විවිධ දේශපාලන මතවාද දරන අයට සම්බන්ධ විය හැකි ලෙසයි එය සැකසී තිබෙන්නේ.......''

*(යුක්තිය 4 වෙනි තට්ටුව සමඟ පුබුදු ජයගොඩ පැවැත්වූ සංවාදය 2012 පෙබරවාරි 05)*

ඇයි යකෝ, නිශ්චිත දේශපාලන මතවාදයක් නැතුව සමාජ විප්ලවයක් කරන්න පුළුවන්ද ? 'ජවිපෙ සමාජ විප්ලවේ කරන්නෙ නෑ. අපි ඒ වගකීම අතට ගන්නවා.' කියලා පටන් ගත්තු ව්‍යාපාරේ ගෙනත් නවත්තපු තැන මෙතනද ? 'බොරු බේගල් කියලා මිරිගුව පෙන්වලා රවට්ටලා ජවිපෙන් එලියට ඇදලා ගත්තු කොල්ලන්ව - කෙල්ලන්ව ගෙනත් නවත්තපු තැන මෙතනද ? මේවා සහගහන අපරාධ! ' කියලා කෙනෙක් කිව්වොත් වැරදිද?

ඕපාත කිව්වේ මෙහෙමයි.

''ඇත්තටම කියනවා නම් ලංකාවේ වමේ ව්‍යාපාරය විළි රුදාවකින් පසුවන අවස්ථාවක් මේක. ජනතාව අළුත් වමක් ඉල්ලනව''. ඕපාත.

(ලංකාදීප 2011-10-05 පිටුව 18 )

ඒ කියාපු විළිරුදාවෙන් කන්දක් විළි ලා වදා ගත්තු මී පැටියද මේ කියලා ඇහුවාම දෙන උත්තරේ මොකක්ද ? පුබුදු ජයගොඩයි, චමීර කොස්වත්තයි දෙන්නම ඔපාත කියන ඒ, 'අළුත් වම' ගැන කියන්නේ මෙහෙමයි.

''ප්‍රශ්නය :- ඔබේ කණ්ඩායම කිසිම කණ්ඩායමක් සමග සන්ධාන ගත වෙන්නේ නැද්ද?
පිළිතුර :- මෙහෙමයි. සමාජය ගැන හිතන නමුත්, වාමාංශික නොවූ හොඳ කණ්ඩායම් ඉන්නවා. එබඳු බුද්ධිමතුන් කලාකරුවන්, මාධ්‍යවේදීන්, ශිෂ්‍යයින් ඇතුළු මානව හිතවාදී බලවේග සමඟ සන්ධාන ගත වීමට අප අපෙක්ෂා කරනවා.''

(පුබුදු ජයගොඩ - ලක්බිම 2011/12/11. පිටුව 10)

චමීර කොස්වත්ත අළුත් වම ගැන දිවයිනට කියන කතාව.
''ප්‍රශ්නය :- පාලකයින්ට එරෙහිව අරගල කරනවා නම් එය තනිව කිරීම නෙවෙයි, අනෙකුත් පක්ෂ සහ කණ්ඩායම් සමග එක්ව හඬනැගීම නොවේද, සුදුසුම ක්‍රමය?
පිළිතුර :- ඇත්ත. අනෙකුත් පක්ෂ, සංවිධාන, පක්ෂවලට අයිති නැති බුද්ධිමතුන්, කලාකරුවන්, මාධ්‍යවේදීන් ආදී සියලු දෙනා සමග එකතුවෙලා අපේ අයිතීන් වෙනුවෙන් සටන් කළ යුතු යැයි කියන එක පිළිගන්නවා. මේ සඳහා නායකත්වය ගතයුත්තේ ජන අරගල ව්‍යාපාරයමයි කියන හීනමානය අපට නැහැ. ප්‍රතිපත්ති මතවාද වෙනස් වෙන්න පුලුවන්.''

(චමීර කොස්වත්ත - දිවයින 2012/01/15.)

මේ කියන විදිහට මේ පක්ෂයේ නායකත්වය ගන්න, මාක්ස්වාදී හෝ වාමාංශික නොවූ ඕනෑම කෙනෙකුට (මර්වින් සිල්වා, දුමින්ද සිල්වා, නිශාන්ත මුතුහෙට්ටිගම වැනි) පුළුවන්.
මොනවා වුනත් ඕක තමයි ඇත්ත කතාව. මීරිගුවට රැවටුණ අවංක හිත හොද අය ගැන දුකයි. ජන අරගල නඩෙන් අවසානේ අහන්න තියෙන්නේ මෙච්චරයි.

අහෝ ! ජන අරගල
බොහෝ ස්වප්නයන් පොදි බැඳ
සහෝදර පෙම සිඳ බිඳ
කොහේ යන ගමනක්ද සකිසඳ ?

( මෙම 'පුවත් උපුටා ගැනීම්' ලෙස දක්වා ඇත්තේ, ලිපියට අවශ්‍ය කරන කෙටි උපුටා ගැනීම් කිහිපයක් පමණි. මෙහි දක්වා ඇති මාධ්‍ය තොරතුරු අනුව ඒවායේ සමස්ත ලිපි හා පුවත් වාර්තා සොයා ගෙන කියවන්න. එවිට මෙම ගැටළුව තේරුම් ගැනීමට මීටත් වඩා බොහෝ තොරතුරු ලබාගත හැකි වේවි.)

---

කියවා අතින් අත යවන්න.